# ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

## ප්‍රසම්පාදන දැන්වීමයි

## ආපනශාලාව සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම

## සඳහා ලංසු කැඳවීම

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් නාරාහේන්පිට නිල මැදුර පරිපාලන සංකීර්ණයේ **"ආපනශාලාව සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම - 2021/2022"** පිණිස සුදුසුකම්ලත් ආයතන වෙතින් මුද්‍රා තබනු ලැබූ ලංසු කැඳවනු ලැබේ.

**02.** **ආපනශාලාව සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම** සඳහා ආපසු නොගෙවනු ලබන **රු.3,000.00** ක මුදලක් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ගණකාධිකාරී (ගෙවීම්) වෙත ගෙවා ලබා ගන්නා වූ රිසිට්පත සමග ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු 2021.10.08 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා "නිල මැදුර", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 ලිපිනයේ 16 වන මහලේ

ප්‍රසම්පාදන ඒකකයෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය. එමෙන්ම ඔබට නොමිලේ ලංසු ලියවිලි පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහාද ඉහත දිනයන්හි දී එය පරීක්ෂා කර බැලිය හැකිය.

03. මුද්‍රා තබන ලද ලංසු "මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම මුද්‍ර තබා 2021.10.08 වන දින ප.ව. 2.00 ට පෙර ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, "නිල මැදුර" පරිපාලන සංකීර්ණය, 16 වන මහළ, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ 16 වන මහලේ මුල්‍ය අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ කටයුතු කළ යුතුය. මිල ගණන් ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ "නිල මැදුර" ගොඩනැඟිල්ලේ ආපනශාලාව සඳහා මිල ගණන් කැඳවීම - 2021/2022"** යනුවෙන් සඳහන් කළ යුතුය.

04. ලංසු විවෘත කිරීම 2021.10.08 වන දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම සිදු කරන අතර එදින එම වේලාවට ඔබ හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

05. ආපනශාලාවේ විදුලිබලය සහ ජලය නොමිලේ ලබා දෙන අතර මේස, පුටු, අනෙකුත් උපකරණ හා ඉවුම් පිහුම් උපකරණ දී ඇති කොන්දේසි වලට යටත්ව මෙම අමාත්‍යාංශය විසින් සපයනු ලබන අතර, අදාළ පරිශ්‍රය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලංසු ඉදිරිපත් කිරීමට හැකිය.

06. ආපනශාලාව සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් පැන නගිනු ලබන ඕනෑම කරුණකදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

වැඩි විස්තර ප්‍රසම්පාදන ඒකකයේ දුරකතන අංක 011-2050420 හා ඊ -මේල් procurement.ha@gmail.com විමසා ලබා ගත හැකිය.

සභාපති - ප්‍රසම්පාදන කමිටුව,<br>
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,<br>
"නිල මැදුර"<br>
ඇල්විටිගල මාවත<br>
කොළඹ 05

2021.09.24